# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1916/36 - 2015 මැයි මස 29 වැනි සිකුරාදා - 2015.05.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 39(1) වගන්තිය හා ජාතික ක්‍රීඩා සංගම් නියෝග මාලාවේ 54(3) වගන්තිය යටතේ විධානය

සංචාරක හා ක්‍රීඩා අමාත්‍ය නවීන් එරන්ජන් දිසානායක වන මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 39(1) වගන්තිය යටතේ අංක 1907/22 හා 2015.03.25 දිනැති රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද විධානය ප්‍රකාරව සියළු ජාතික ක්‍රීඩා සංගම් අදාළ නාම යෝජනා කැඳවා 2015 මැයි මස 15 දිනට ප්‍රථම නිලවරණ පැවැත්විය යුතු විය. එබැවින් මේ වන විට නියමිත කාල සීමාව තුළ නිලවරණ පැවැත්වීමට අපොහොසත් වී ඇති හා නීත්‍යානුකූලව නිලවරණ නොපවත් වන ලද සියළු ක්‍රීඩා සංගම්වල නිලවරණ නැවත පවත්වන තෙක් එම සංගම්වල කටයුතු මැනවින් පවත්වාගෙන යාම සඳහා නිසි බලධාරියා ලෙස ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් කේ. ඩී. එස්. රුවන්චන්ද්‍ර මහතා පත්කර ඇති බවට 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 39(1) වගන්ති ප්‍රකාරව පහත සියළු ක්‍රීඩා සංගම් වෙත දැනුම් දෙමි.

ඒ අනුව 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 41 වන වගන්තිය යටතේ 2013 අගෝස්තු මස 30 වැනි දින ප්‍රකාශයට පත් කරන ලදුව අංක 1825/38 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 54(3) වගන්තිය යටතේ පහත සඳහන් වන ජාතික ක්‍රීඩා සංගම් පිළිබඳ රෙගුලාසි ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් කේ. ඩී. එස්. රුවන්චන්ද්‍ර මහතාට පහත සඳහන් ජාතික ක්‍රීඩා සංගම්වල නව නිලධාරී මණ්ඩල තෝරා ගැනීමේ නිලවරණ කැඳවීම හා පැවැත්වීමට මෙයින් නියම කරමි.

1. බැඩ්මින්ටන්
2. හොකී
3. රග්බි පාපන්දු
4. ගොල්ෆ්
5. ටෙනිස්
6. බ්‍රිජ්
7. බොක්සිං
8. වොලිබෝල්
9. ඔරු පැදීම
10. සැහැල්ලු පන්දු ක්‍රිකට්
11. ආබාධිතයින්ගේ ක්‍රීඩා
12. මෝටර් සයිකල් ක්‍රීඩා
13. ත්‍රෝ බෝල්
14. සම්ප්‍රදායික කරාටේ
15. අත්පන්දු
16. රයිෆල්
17. කැරම්

නවීන් එරන්ජන් දිසානායක,
සංචාරක හා ක්‍රීඩා අමාත්‍ය.

2015 මැයි මස 16 වැනි දින,
කොළඹ දී ය.

06 -423


1A - G 21602 — 16 (2015/05)   ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*